# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

JICA

# ජයිකා (JICA) අරමුදල් සහිත සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

## ණය ගිවිසුම් අංක SL-P118

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HAMSIP) සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) වෙතින් ණයක් ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශික්ෂණ රෝහල් 05 ක (ජාතික රෝහල මහනුවර, ශික්ෂණ රෝහල අනුරාධපුර, ශික්ෂණ රෝහල කුරුණෑගල, ශික්ෂණ රෝහල බදුල්ල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල) ගොඩනැගිලි පහසුකම් වැඩිදියුණු කිරීම සහ හෘද වාහිනී රෝග හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා උපකරණ ලබා ගැනීම, වෛද්‍ය රසායනාගාර තාක්ෂණික (MLT) පුහුණු පාසල් නංවාලීම සහ උපකරණ සැපයීම සමග සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය ශක්තිමත් කිරීමයි.

2. ව්‍යාපෘතිය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, කොළඹ පිහිටි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත් සහ පළපුරුදු ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ව්‍යාපෘති වටිනාකම -එක්සත් ජනපද ඩොලර් මිලියන 25 ට වැඩි සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ට අඩු.

| අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | 01/2026 දරන MSD චක්‍රලේඛය අනුව වැටුප් කාණ්ඩය |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | A |
| 02 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | B |
| 03 | ප්‍රසම්පාදන විශේෂඥ | 01 | C |
| 04 | ව්‍යාපෘති ඉංජිනේරු | 01 | D |
| 05 | ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | D1 |
| 06 | ව්‍යාපෘති ලේකම් | 01 | F |
| 07 | කළමනාකරණ සහායක | 02 | සහායක කාර්ය මණ්ඩලය |
| 08 | රියදුරු | 02 | සහායක කාර්ය මණ්ඩලය |
| 09 | කාර්යාල සහායක | 02 | සහායක කාර්ය මණ්ඩලය |

3. **නියමයන් සහ කොන්දේසි :**

- වේතන, නියමයන් සහ කොන්දේසි වරින් වර සිදුකරන සංශෝධනවලට යටත්ව, 2026 පෙබරවාරි 02 දිනැති අංක 01/2026 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුකූල විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු හැට හතරකට (64) අඩු විය යුතුය.
- පත්වීම වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව ව්‍යාපෘති කාලය දක්වා දීර්ඝ කළ හැකිය.
- විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල පූර්ව පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

4. **අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

- එක් එක් තනතුර සඳහා වන විස්තරාත්මක යොමු අනුදේශ (TOR) සහ නියමිත අයදුම්පත්‍රය බාගත කිරීම සඳහා https://www.health.gov.lk/moh-pages/vacancies වෙත පිවිසෙන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.
- සියලුම අයදුම්කරුවන් නියමිත අයදුම්පත්‍රය සම්පූර්ණ කර, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිත ජීව දත්ත පත්‍රිකාවක් (CV) සහ සියලුම අදාළ සහතිකවල පිටපත් අමුණා 2026 අප්‍රේල් 10 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ addiseceng@health.gov.lk යන ඊමේල් ලිපිනය හරහා එවිය යුතුය.

**අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා),**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**01 වන මහල, අංක 385, බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.**

5. **වැදගත් :**

- අයදුම් කරන තනතුර දූයි ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සහ ඊමේල් පණිවිඩයේ ශීර්ෂ තීරුවෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.
- රාජ්‍ය අංශයේ සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
- අසම්පූර්ණ අයදුම්පත් හෝ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නේ කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි.

**ලේකම්,**